# II. 1968 ආර්ථික හා මූල්‍ය හැඩගැස්ම

## (අ) ජාතික නිෂ්පාදිතය සහ වියදම

### මූර්ත නිමැවුම සහ මූර්ත ආදයම

සියයට 8.3 ක මූර්ත නිමැවුමේ වැඩිවීමක් ඇතිකර ගැනීමේ හේතුවෙන් 1968 දී ලංකාව ඉහළ ආර්ථික වෘද්ධියක් අත්දුටුවේය. ඒකජනක මිම්මෙන් මනින කළ මූර්ත නිමැවුම සිත් ගන්නා වේගයක්වූ සියයට 6.1 වේගයකින් වැඩි විය.

බොහෝ ආර්ථික අංශයන් හි ඉහළ මට්ටමක ක්‍රියාකාරිත්වයක් දක්නට ලැබිණි. කෘෂි-කර්මාන්තයේ, මූර්ත නිමැවුම සියයට 6.9 කින් වැඩි විය. කෙසේ නමුත්, තැනීම් හා නිෂ්පාදන අංශයන්හි වර්ධනය සැලකිය යුතු ලෙස කැපී පෙනින. මෙම අංශයන්හී මූර්ත නිමැවුමේ අගය, පිළිවෙලින් සියයට 27.1 කින් සහ 7.7 කින් වැඩි විය.

මූර්ත නිමැවුමේ ඉහළ වර්ධන වේගයට, මෑත වර්ෂවල දී රජය විසින් සලසන ලද දිරි ගැන්-වීම් තරමක් දුරට හේතු විය. කෘෂිකර්මාන්තයේ ලබා ගත් වර්ධනයට සතුටුදයක දේශගුණික තත්ත්වයන් ද අමතර වශයෙන් හේතු විය. රජය විසින් ආහාර නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ගනු ලැබූ, වාරිමාර්ග පහසුකම් වැඩි කිරීම, කෘෂිකාර්මික ණය පහසුකම් වැඩි කිරීම, සහන මිලට පොර, කෘෂිකාර්මික ප්‍රචාරක වැඩ පිළිවෙල ආදී, පියවරවල් වල සාර්ථක භාවය බොහෝ දුරට නිරූපනය කරමින්, දේශීය කෘෂි කර්මාන්තයේ, වී නිමැවුම බුසල් දශ ලක්ෂ 9.5 කින් හෙවත් සියයට 17.2 කින් සහ වෙනත් බෝග වර්ග වල සහ ධීවර කර්මාන්තයේ මූර්ත නිමැවුමේ අගය සියයට 4.9 කින් වැඩි විය. අපනයන කෘෂිකාර්මික අංශයේ, තේ, රබර්, පොල් සහ වෙනත් භෝග වර්ගවල නිමැවුම 1968 වැඩි විය. තේ සහ පොල් නිෂ්පාදනය වැඩිවීම සතුටුදයක දේශගුණික තත්ත්වය හා සෑහෙන දුරකට පොර භාවිතය වැඩි කිරීම නිසා සිදු වූ අතර, රබර් නිෂ්පාදනය වැඩි වීමට හේතු වූයේ, විශාල වශයෙන් වගාවට නතු කරන ලද වතුවලින් ඵලදාව ලැබීමය.

සුළු අපනයන භෝග වර්ගවල වටිනාකම ද, ස්ථාවර මිල අනුව, 1968 දී 12.6 ක සීඝ්‍ර වේගය-කින් වැඩි විය. මෙය සෑහෙන ප්‍රමාණයකට විදේශීය විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමය මගින් සලසන ලද දිරි ගැන්වීම නිසා සිදු විය. මෙම ක්‍රමය යටතේ තේ, රබර්, පොල්, පොල් තෙල්, කපාපු පොල් සහ කොප්පරා හැර වෙනත් දේශීය අපනයන කරන අපනයනයකයන්ට, බලධරයන්ට පවරනු ලබන අපනයනවල, විදේශීය විනිමය වටිනාකමෙන්, රුපියල් අනුව සියයට 44 ක ආධිත්‍යයක් හිමි වෙයි.

නිෂ්පාදන අංශයෙහි, 1968 පෙර වර්ෂවල දී, වර්ධනය වලක්වාලූ ප්‍රධාන සාධකයක් වූයේ, ආනයන සීමා කිරීම් හේතු කොට ගෙන, ආනයනය කළ අමු ද්‍රව්‍ය ප්‍රමාණවත් නොවීමය. මෙම සීමා කිරීම් හේතු කොට ගෙන බොහෝමයක් ආයතනයන් පූර්ණ ධාරිතාවට වඩා අඩු මට්ටම-කින් ක්‍රියාත්මක විය. 1968 මැයි මස විදේශීය විනිමය හිමිකම් සහතික ක්‍රමය හඳුන්වා දීමත් සමග ම අමු ද්‍රව්‍යවල තත්ත්වය සැලකිය යුතු ලෙස යහපත් වූ අතර, මෙම ක්‍රමය යටතේ වූ විවෘත පොදු බලපත්‍ර මගින් විශාල අමු ද්‍රව්‍ය ප්‍රමාණයක් ආනයනය කරන ලදී. මෙම ක්‍රමය හඳුන්වා දීමෙන්, අමු ද්‍රව්‍ය හිඟවේ යැයි පැවැති අවිනිශ්චිතතාවය දුරුකොට, පවත්නා අමු ද්‍රව්‍ය තොග සක්‍රියභාවයට පත් කිරීමට සම්පූර්ණයෙන්ම වාගේ වහාම හැකි විය. නිෂ්පාදකයන් විසින් සැලකිය යුතු අමු ද්‍රව්‍ය ප්‍රමාණයක් ආනයනය කිරීම සඳහා ඇණවුම් ද කරන ලදී. මෙම ක්‍රමය මගින් සලසන ලද දිරි ගැන්වීම් යටතේ, කර්මාන්ත නිමැවුමේ අගය (තේ, රබර් සහ පොල් හැර) ස්ථාවර මිල අනුව සියයට 11.4 කින් ඉහළ ගියේ ය. විදුලි යන්ත්‍රවල සියයට 85.2 කද, රබර් භාණ්ඩවල සියයට 97.9 කද, නූල් කැටීමේ සහ රෙදි විවීමේ සියයට 19.4 කද, රසකැවිලි සියයට 25.1 ක ද, සකසන ලද වෙනත් ආහාර ද්‍රව්‍යවල සියයට 114.7 කද වශයෙන් පවත්නා මිල අනුව, නිෂ්පාදිත වටිනාකමේ කැපීපෙනෙන වැඩිවීම් දිස් විය. කාර්මික භාණ්ඩ සඳහා පැවැති අධි ඉල්ලුම් 1968 කාර්මික නිෂ්පාදනය ප්‍රසාරණය වීමට පෙළඹ විය.

1966 ට පෙර වර්ෂවල, ආනයනය කළ ගොඩනැගිලි උපකරණවල හිඟකම හේතු කොට ගෙන, තැනීම් කටයුතුවල ආර්ථික ක්‍රියාකාරිත්වය සෙමින් සිදු විනි. කෙසේ නමුත්, 1966 සහ 1967 දී මෙම ද්‍රව්‍යවල සුලභතාවය වැඩිවීම හේතු කොට ගෙන, ක්‍රියාකාරිත්වය ඉහළ මට්ටම-කින් පැවැතින. ගොඩනැගිලි උපකරණවල සුලභතාවය වැඩිවීමට හේතු කොට 1968 දී තැනීම් කටයුතු සීඝ්‍ර ලෙස වැඩි විය. ගොඩනැගිලි උපකරණ ආනයනය කිරීම ලිහිල් කළ, 1968 මැයි මස විදේශීය විනිමය හිමිකම් සහතික ක්‍රමය හඳුන්වා දීමත් සමග, වෙළෙඳුන් වෙත

පැවැති තොග අඩු කිරීමෙන් සහ මාස කිහිපයකට පසු, ආනයනය කළ උපකරණ ලඟාවීමේ හේතුවෙන් ගොඩනැගිලි තනන්නන්ට, ගොඩනැගිලි උපකරණ සැපයීමසුලභ කිරීම සැහෙන දුරකට වහාම වැඩි කරන ලදී. සිමෙන්ති, සංයුක්ත මණ්ඩලය මගින් සිමෙන්ති නිෂ්පාදනය සියයට 16 කින් වැඩි කිරීම, මෙම ද්‍රව්‍යයේ පැවැති හිඟය අඩු කිරීමට හේතු වූ ප්‍රධාන සාධකය විය. තැනීම් කටයුතුවල එක් එක් අවස්ථාවල දී එකතු වූ අගය, ස්ථාවර මිල අනුව සියයට 27.1 කින් ඉහළ ගොස් ඇති බව ඇස්තමේන්තු කර ඇත.

ඉහත විස්තර කළ ප්‍රධාන අංශයන්හි සීඝ්‍ර ප්‍රසාරණයෙන්, සේවා සඳහා ඇති වූ ඉල්ලුම හේතු කොට ගෙන සමහර සේවාවන්හි නිමැවුමේ වැඩිවීමක් ඇතිවිය. බැංකු කටයුතුවල, වෙළඳාම සහ ගමනාගමන කටයුතුවල, සැහෙන දුරකට අඩංගු වන කෘෂිකර්මාන්තයේ, කර්මාන්තයේ සහ තැනීමේ කාර්යයන්හි වැදගත් යෙදුම් වල, ඒ ඒ අවස්ථාවලදී එකතු වූ අගය සීඝ්‍ර ලෙස වැඩි වූ බව පෙනේ. රාජ්‍ය පරිපාලනයෙහි ඒ ඒ අවස්ථාවලදී එකතු වූ අගයෙහි පවත්නා මිල අනුව සියයට 17.7 ක ඉහළ යාමක් වාර්තා වී ඇත. මෙය සැහෙන දුරකට රජයේ සේවකයන්ට ගෙවන ලද ඉහල වේතන නිසා සිදුවිය. මූර්ත මිම්මෙන් මනින කළ, මෙම වැඩි වීම, අඩුවූ අතර, එය සියයට 11.1 ක් වීය. මගීන් ගෙනයාමේ සේවා, සෞඛ්‍ය, අධ්‍යාපනය, විනෝද කටයුතු සහ වෙනත් සේවාවන් සඳහා පැවැති අධි පාරිභෝගික ඉල්ලුම හේතුකොට ගෙන එම සේවාවල නිමැවුමේ අගය ද ඉහල ගියේය. සේවා අංශයේ ඒ ඒ අවස්ථාවලදී එකතු වූ අගයේ, සමස්ත වැඩිවීම ස්ථාවර මිල අනුව මිල සියයට 5.8 ක් වීය.

1968 දී දළ දේශීය නිෂ්පාදිතයේ එකතුව, වර්තන මිල අනුව ආගණිත කළ විට, සියයට 19.3 කින් ඉහළ ගොස් ඇත. මෙය සැහෙන දුරකට මූර්ත නිමැවුමේ ප්‍රසාරණය හේතුකොට ගෙන සහ තරමක් දුරට මිල මට්ටම් ඉහළ යෑම නිසා සිදුවී ඇත. නිර්යාත ද්‍රව්‍යවල මිල පසුගිය වර්ෂයට වඩා සැලකිය යුතු ලෙස අධික වීය. 1968 දී අපනයන මිල දර්ශකය සියයට 19.9 ක ඉහළ යාමක් වාර්තා ගත විය. කාර්මික අමුද්‍රව්‍ය හා පෝර වර්ග වැනි ආනයනය කළ යෙදැවුම්-වල මිල අධිකවීම නිසා සැහෙන දුරකට දේශීය වශයෙන් නිෂ්පාදිත බොහොමයක් භාණ්ඩවල මිල ද ඉහළ ගියේය. 1967 නොවැම්බර් මස රුපියල අවප්‍රමාණය කිරීම සහ 1968 මැයි මස විදේශීය විනිමය හිමිකම් සහතික ක්‍රමය හඳුන්වා දීමෙන් ප්‍රධාන ප්‍රතිඵලය වූයේ ආනයන කළ යෙදැවුම්වල මිල ඉහළ යාමය. ඇත්ත වශයෙන්ම කෘෂිකර්මාන්තයට සහ කර්මාන්තවලට පමණක් නොව සේවාවන්ටත් බලපෑ, යෙදැවුම්වල මිල මට්ටමේ සාමාන්‍ය වැඩිවීමක් දක්නට ලැබිණ. 1968 දී සේවාවන්හි මිල මට්ටම ද ශීඝ්‍ර ලෙස ඉහල ගිය බව වාර්තා වී ඇත. පෞද්ගලික අංශයේ සමහර සේවකයන්ට ගෙවන ලද වැඩි වැටුප් සමහර නිෂ්පාදිත භාණ්ඩවල සහ සේවාවල ඉහළ යාමට හේතු වූ වියදම් සාධක අතර, වැදගත් සාධකයක් ද වේ. හිඟකම නිසා ද සමහර මිල මට්ටම් ඉහල ගියේය. 1967 දී පනවන ලද ආයාත තහනමට පසු මෙම භාණ්ඩය හිඟවීම හේතු කොට ගෙන 1968 දී අර්තාපල්වල මිල මෙලෙස ඉහල ගිය බව පෙනේ.

කෙසේ නමුත්, සමහර මිල ඉහළ යාම්, නිෂ්පාදනය කෙරෙහි ඵලදායී ලෙස බලපා ඇති බව කිව යුතුය. මෙලෙස අර්තාපල් නිෂ්පාදනය 1967 මහ කන්නයේ හොණ්ඩර 57,000 සිට 1968 මහ කන්නයේ හොණ්ඩර 1,40,000 දක්වා වැඩි කිරීමට ගොවීන් පෙළඹ වූ සාධකයක් වූයේ මෙම භාණ්ඩයේ නිෂ්පාදක මිල ඉහල යාමය.

1968 මූර්ත නිමැවුමේ වර්ධනය ඇගැයීමේදී, වෙළඳ අනුපාතයේ වෙනස අපනයනවලින් ආනයනය ලබා ගැනීමේ හැකියාව වෙනස් කරන හෙයින්, එහි වෙනස ගණන් ගත යුතුව ඇත. 1968 දී අපනයන මිල මට්ටම් සියයට 19.9 කින් වැඩිවිය. මෙසේ අපනයන මිල මට්ටම් ඉහල ගියේ වී නමුත්, ආනයන මිල මට්ටම් සියයට 30.2 කින් ඉහල යාම හේතු කොට ගෙන වෙළඳ අනුපාතය සියයට 7.9 කින් පිරිහිණ. මෙයින් අදහස් වන්නේ කිසියම් අපනයන ප්‍රමාණයකට, පෙර වර්ෂවල දී ලංකාවට ලබා ගත හැකි වූ ප්‍රමාණයට වඩා අඩු ආනයන ප්‍රමාණයක් ලබා ගැනීමට හැකි වූ බවය. වෙළෙඳ අනුපාතයේ අයහපත් තත්වය හේතු කොට ගෙන, නැති වූ ආදයම් සඳහා සාධක වියදම් මිල අනුව කළ, මූර්ත නිෂ්පාදිතයේ ඇස්තමේන්තු හා ගැලපීමෙන්, මූර්ත ජාතික ආදයමේ ඇස්තමේන්තු ලබා ගනු ලැබේ. මූර්ත නිමැවුම සියයට 8.3 කින් වැඩි වූ නමුත්, මූර්ත ජාතික ආදයම වැඩි වූයේ සියයට 7.7 කින් පමණි. 1968 මූර්ත නිමැවුමේ සීඝ්‍ර ප්‍රාසාරණයෙන් ආර්ථිකයට සැලසෙන ඵලදායීතාවයන් වෙළෙඳ අනුපාතයේ අයහපත් සංචලනය නිසා තරමක් දුරට අඩු කරලීය.

පසුගිය වර්ෂයට වඩා සියයට 2.2 ක වැඩිවීමක් වාර්තාගතව ඇති 1968 වර්ෂය සඳහා වූ ( වර්ෂයේ මැද ) ජනගහනය 11,964,000 වශයෙන් ඇස්තමේන්තු කර ඇත. ඒක ජන නිෂ්පාදනය, වර්තන මිල අනුව සියයට 17.1 කින් ඉහළ ගියේ ය. ස්ථාවර මිල අනුව, වැඩිවීම සියයට 6.1 ක් වීය. ඒක ජන මූර්ත ආදයමේ සියයට 5.5 ක වැඩිවීමක් වාර්තාගතව ඇත.

## සටහන II (අ) 2

### ප්‍රධාන කෘෂිකාර්මික බෝග — වගාකළ බිම් ප්‍රමාණය.

| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 | 1968 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **තේ** | | | | | | | | | | |
| මුලු අක්කර ගණන * — අක්කර ... | 579,652 | 581,821 | 587,401 | 591,118 | 587,375 | 591,988 | 594,308 | 596,445 | 598,814 | 597,490 |
| යලි වගා කළ අක්කර ගණන අක්කර ... | — | 1,129 | 2,427 | 4,198 | 6,491 | 9,691 | 14,315 | 16,393 | 21,662 | 26,980 |
| **රබර්** | | | | | | | | | | |
| මුලු අක්කර ගණන — අක්කර ... | 668,178 | 668,948 | 670,830 | 674,274 | 675,683 | 669,179 | 566,639 | 567,744 | 572,431 | 572,909 |
| යලි වගා කළ අක්කර ගණන අක්කර ... | 133,148 | 151,043 | 169,730 | 187,686 | 203,291 | 216,834 | 229,336 | 240,919 | 250,995 | 262,135 |
| **වී** | | | | | | | | | | |
| අස්වැද්දූ අක්කර ගණන — අක්කර දහස් ... | 1,202.7 | 1,392.9 | 1,406.8 | 1,492.3 | 1,525.3 | 1,534.7 | 1,242.6 | 1,512.3 | 1,566.9 | 1,634.2 |
| මහ ... ... ... අක්කර දහස් ... | 744.7 | 857.0 | 887.5 | 936.3 | 981.8 | 979.8 | 795.7 | 1,007.1 | 1,006.4 | 1,077.9 |
| යල ... ... ... අක්කර දහස් ... | 458.0 | 535.9 | 519.3 | 556.0 | 543.5 | 554.9 | 446.9 | 505.2 | 560.5 | 556.3 |

මූලයන් : තේ සහ රබර් පාලකගේ පරිපාලන වාර්තාව ;
සංගණන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව.

*. 1959 — 1964 දක්වා සංඛ්‍යා, ලේඛනගත අක්කර ගණනට අදාලවේ. 1965 සිට සංඛ්‍යා, වගා කළ නියම අක්කර ප්‍රමාණයට අදාළ වේ.

**සම්පත් ප්‍රයෝජනයට ගැනීම**

ලබාගත හැකි සම්පත් සහ ඒවා උපයෝගී කොට ගත් අයුරු විශ්ලේෂණය කිරීමේ දී ආනයන වලින් ලත් සම්පත් සියයට 17.5 කින් සහ දේශීය නිෂ්පාදනයෙන් ලත් සම්පත් සියයට 13.9 කින් වැඩි වූ බව පෙන්වයි. උපයෝගී කොට ගැනීම සම්බන්ධයෙන් වැඩි වූ සම්පත් ප්‍රමාණයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ප්‍රාග්ධන සම්පාදනයට වෙන් කරන ලදී. ප්‍රාග්ධන සම්පාදනය සියයට 21.1 ක වැඩිවීමක් පෙන්වීය. පාරිභෝජනය සඳහා උපයෝගී කොට ගත් සම්පත් ප්‍රමාණය සියයට 12.8 කින් සහ අපනයන සඳහා වූ සම්පත් ප්‍රමාණය සියයට 17.1 කින් ඉහල ගියේ ය. 1968 දී ඇති වූ මිල ගණන් ඉහළ යාමේ හේතුවෙන් පවත්නා මිල අනුව, ආගණිත කොට ඉහත දක්වා ඇති සංඛ්‍යා තොරතුරු, 1968 සම්පත් නියමාකාරයට වෙන් කිරීම පිළිබඳව යථාර්ථ ස්වරූපය පෙන්වා නොදෙයි. මූර්ත සම්පත්වල වැඩිවීම, ස්ථාවර මිල අනුව දක්වා ඇති සංඛ්‍යා තොරතුරුවලින් මෙම සම්පත්වල වැඩිවීම, ආනයන ප්‍රමාණය සුළු වශයෙන් පහළ වැටීමත් සමගම සම්පූර්ණයෙන් ම සිදු වූයේ දේශීය නිෂ්පාදිතයෙන් බව පෙන්වා දෙයි. සම්පත් උපයෝගී කොට ගැනීම අනුව බලන කල, වැඩිවූ සම්පත් ප්‍රමාණයෙන් ප්‍රාග්ධන සම්පාදනයට සහ පාරිභෝජනයට වෙන් කළ ප්‍රමාණය මූර්ත වශයෙන් පිළිවෙලින් සියයට 5.0 සහ සියයට 5.6 පමණක් වීය. අපනයනය කළ මූර්ත සම්පත්වල වැඩිවීම, සියයට 5.5 පමණක් වීය. දළ දේශීය වියදම අනුව මණින කළ, දේශීය නිෂ්පාදනය මාර්ගයෙන් සම්පත් ලබා ගැනීම, සමස්ත ඉල්ලුමට වඩා අඩුවීමේ ප්‍රවනතාවය 1968 වර්ෂයෙන් දිගටම පැවැති බව පෙණින. 1968 දළ දේශීය වියදම වෙළෙඳ මිල අනුව, දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 103.6 ක් වීය. පසුගිය වර්ෂවල දී මෙන්, මෙම හිඟය පියවා ගන්නා ලද්දේ, ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර ණයගැති භාවය රුපියල් දශ ලක්ෂ 368.8 කින් වැඩි කර ගැනීමෙනි.

ඉල්ලුම් අංශයෙන් බලන කල, පෞද්ගලික අංශය, රාජ්‍ය සහ රාජ්‍ය සංස්ථාවල ඉහළ මට්ටමක පැවැති පාරිභෝජන ඉල්ලුමේ සහ ආයෝජන ඉල්ලුමේ ප්‍රතිඵලය වූයේ, 1968 ආර්ථික ප්‍රසාරණයයි. පෞද්ගලික පාරිභෝජන වියදම සියයට 12.5 කින් ඉහළ ගිය අතර, ප්‍රාග්ධන සම්පාදනය සියයට 21.1 කින් වැඩි විය. රජයේ පාරිභෝජනය ද සියයට 14.6 කින් වැඩි වීය.

**නිෂ්පාදන උපනතීන්—කෘෂිකර්මාන්තය**

**තේ**

1966 දී රාත්තල් දශ ලක්ෂ 490 සිට, 1967 දී රාත්තල් දශ ලක්ෂ 487 දක්වා පහල වැටුණු තේ නිෂ්පාදනය, 1966 දී රාත්තල් දශ ලක්ෂ 496 දක්වා ඉහල ගියේය. කෙසේ නමුත්, මෙය 1965 දී ලබාගත් රාත්තල් දශ ලක්ෂ 503 ක ඉහල මට්ටමට වඩා අඩු විය. ( උඩරට, මැද රට, පහත රට, ) ආදී, සෑම ප්‍රදේශයකම වැඩුන තේ නිසා, 1968 වර්ෂයේ සිදුවූ වැඩිවීම, යහපත් දේශගුණික තත්වයන්ගේ ද ලක්ෂණයක් ලෙස ගිණිය හැකිය.

තේ නැවත වගා කිරීමේ පිහිටාධාර ක්‍රමය සහ තේ ඉඩම් නැවත නගා සිටුවීමේ ක්‍රමය දිගටම 1968 දීත් ක්‍රියාත්මක විය. තේ නැවත වගා කිරීමේ පිහිටාධාර ක්‍රමය යටතේ, 1967 නැවත වගා කළ අක්කර 5,270 හා සසඳන කල, 1968 දී අක්කර 5264 ක් නැවත වගා කර ඇත. 1967 අවසානය වන විට, තේ වගාවට යටත් වූ 597,490 මුලු අක්කර ප්‍රමාණය හා සසඳන කල, 1968 අවසානය වන විට, අක්කර 598,814 තේ වගාවට නතුව තිබිණ.

තේ වතු වලට, ඔවුන්ගේ කර්මාන්ත ශාලා නවීනකරණය කිරීම සඳහා 1966 දී ආරම්භ කළ කර්මාන්ත ශාලා සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ, වෙළෙඳ බැංකු විසින් 1967 සපයන ලද රුපි. දශ ලක්ෂ 8.4 ණය මුදල් ප්‍රමාණය හා සසඳන කල, 1968 දී රුපි. දශ ලක්ෂ 12.0 ක ණය මුදල් ප්‍රමාණයක් සපයා ඇති බව ඇස්තමේන්තු කර ඇත. මෙම ක්‍රමය යටතේ, ණය මුදල් වලට ගෙවිය යුතු පොළිය සඳහා රජය මුදලින් ආධාර කරයි. පසුගිය වර්ෂයේ රුපිං දශ ලක්ෂ 1.1 ක මුදලින් කල ආධාර දීම් හා සසඳන කල, 1968 දී මුදලින් කළ ආධාර ප්‍රමාණය රුපි. දශ ලක්ෂ 1.7 ක් විය.

නැවත වගා කරන ලද අක්කර 26,980 ක් වූ මුලු අක්කර ප්‍රමාණයෙන්, අක්කර 10,918 ක් සම්පූර්ණයෙන්ම ඵල දැරීමට පටන් ගෙන ඇති බව ඇස්තමේන්තු කර ඇත. නැවත වගා කිරීමේ බලපෑම් ඉදිරි වර්ෂ කිහිපය තුළදී, නිෂ්පාදනය කෙරෙහි දැනෙනු ඇත. නැවත වගා කළ තේ ඉඩම්, තව තවත් ඵල දැරීමට පටන් ගත් විට, 1970 දී තේ නිෂ්පාදනය රාත්තල් දශ ලක්ෂ 540 පමණ වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

—(අ) 2 සංඛ්‍යා සටහන, වගා කළ අක්කර ප්‍රමාණය සහ — (අ) 3 සංඛ්‍යා සටහන ප්‍රධාන කෘෂිකාර්මික භෝග වල නිෂ්පාදිත ප්‍රමාණයන් දක්වයි.

## සංඛ්‍යා සටහන II (අ) 3

## ප්‍රධාන කෘෂිකාර්මික භෝගවල නිමැයුම් ප්‍රමාණය

| | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 | 1968 | පසුගිය වර්ෂයට වඩාවූ වෙනස්වීමේ සියයට ගණන | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | 1966 | 1967 | 1968 |
| තේ (රාත්තල් දශ ලක්ෂ) ... ... ... | 435 | 455 | 467 | 485 | 482 | 503 | 490 | 487 | 496 | — 2.6 | — 0.6 | + 1.8 |
| රබර් (රාත්තල් දශ ලක්ෂ) ... ... ... | 218 | 215 | 229 | 231 | 246 | 261 | 289 | 316 | 328 | +10.7 | + 9.3 | + 3.8 |
| පොල් නිෂ්පාදිත (ගෙඩි දශ ලක්ෂවලින්) ... | 2,183 | 2,601 | 2,811 | 2,549 | 2,991 | 2,676 | 2,461 | 2,416 | 2,601 | — 8.0 | — 1.8 | + 7.7 |
| වී (බුසල් දශ ලක්ෂ) වලින් ... ... ... | 43.1 | 43.2 | 48.1 | 49.2 | 50.5 | 36.3 | 45.7 | 55.1 | 64.6 | +25.9 | +20.6 | +17.2 |

මූලයන් : තේ සහ රබර් පාලකගේ පරිපාලන වර්තා.
ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව.

## රබර්

1967ට වඩා රාත්තල් දශ ලක්ෂ 12 ක් වැඩියෙන් වාර්තා ගත වීමෙන්, රබර් නිෂ්පාදනය දිගටම ප්‍රසාරණය විය. මෙය නැවත වගා කළ ඉඩම් තව තවත් ඵල දැරීමට පටන් ගැනීමේ ප්‍රධාන ලක්ෂණය ලෙස සැලකිය හැකිය. ඉකුත් වර්ෂයේ නැවත වගා කළ අක්කර 10,075 හා සසඳන කල, 1968 අක්කර 11,859 ක් නැවත වගා කොට ඇත.

1968 අවසානය වන විට, රබර් වගාවට නතුව පවතින මුලු ඉඩම් ප්‍රමාණය වූ අක්කර 572,909. අක්කර 262,135 හෙවත් සියයට 45.76 නැවත වගා කොට ඇති ඉඩම් ප්‍රමාණයෙන් යුක්ත වේ, ඵලදාව ලැබෙන නැවත වගා කළ ඉඩම් ප්‍රමාණයෙන්, ප්‍රධාන වශයෙන් වැඩි ඵලදාවක් ලැබෙන බව පෙන්වා දෙමින්, 1967 වඩා රාත්තල් 17 ක් නිපදවමින්, 1968 දී අක්කරයකින් ලැබූ සාමාන්‍ය ඵලදාව රාත්තල් (664) ක් විය.

## පොල්

1965, 1966 සහ 1967 යන වර්ෂවල අඛණ්ඩවම පහල ගිය පොල් නිමැවුම 1968 දී වැඩි වූ බවට වාර්තා වී ඇත. අපනයන ( පොල් ගෙඩි අනුව කල ) සහ දේශීය පාරිභෝජනය 1967 දී දශ ලක්ෂ 2,416 සිට ( සංශෝධිත සංඛ්‍යා තොරතුරු අනුව ) 1968 දී රුපි. දශ ලක්ෂ 2,601 දක්වා, එනම්, 7.7 කින් ඉහල ගියේය. ඉකුත් වර්ෂ තුනේදී ම, පොල් නිමැවුම පහල වැටීමට බලපෑ ප්‍රධාන සාධකය වූ අයහපත් දේශගුණික තත්ත්වය, 1968 දී පොල් නිෂ්පාදනය කෙරෙහි බල නොපෑවේය. පොල්, පෝර පිහිටාධාර ක්‍රමය මගින්, පෝර වැඩියෙන් භාවිතා කිරීමට දිරි ගැන්වීම ද, 1968 නිමැවුම කෙරෙහි බලපෑවේ ය. මෙම පිහිටාධාර ක්‍රමය යටතේ 1967 දී නිකුත් කරන ලද ටොන් 51,193 ක පෝර ප්‍රමාණය හා සසඳන කල, මෙම වර්ෂයේ දී ටොන් 61,000 නිකුත් කරන ලද බවට තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත.

සහාය මිලට සපයන ලද බීජ පොල් ආදී දෑ, නිකුත් කිරීමේ ක්‍රමය, 1968 දී දිගටම ක්‍රියාත්මක විය. මෙම ක්‍රමය යටතේ 1967 දී සැපයූ පොල් පැල, 1,415, 727 හා සසඳන කල, 1968 දී පොල් පැල 1,613,999 ක් සපයා ඇත.

## වී

වී බුසල් දශ ලක්ෂ 55.1 හා සැසැඳිමේ දී, 1968 මුළු වී නිෂ්පාදිතය බුසල් දශ ලක්ෂ 64.6 ක් විය. මෙය බුසල් දශ ලක්ෂ 9.5 ක හෙවත් සියයට 17.2 ක වැඩි වීමයි. ඉකුත් වර්ෂයේ අනුරූප සංඛ්‍යා තොරතුරු හා සසඳන කල මහ කන්නයේ නිෂ්පාදනය සියයට 24.6 කින් වැඩි වූ අතර, යල කන්නයේ නිෂ්පාදනය සියයට 5.5 කින් වැඩි විය. යහපත් දේශගුනික තත්වයන්, අස්වද්දන ලද ඉඩම් ප්‍රමාණය වැඩිවීම, පෝර වැඩියෙන් භාවිතා කිරීම සහ වැඩි ඵලද ලබාදෙන බීජ, දියුණු වගා ක්‍රම යොද ගැනීම ආදිය පිහිටාධාර මගින් ධෛර්‍යමත් වීම සහ රජය විසින් ගනු ලැබූ ප්‍රබල ප්‍රචාරක මාධ්‍යයන් ආදිය, 1968 සිදු වූ වැඩිවීම කෙරෙහි බලපැවැත්වූ වැදගත් සාධකයෝය. අතිරේක සාධකයක්දුයේ විවෘත්ත වෙළඳ පොලේ නිෂ්පාදනයන්ගේ සාමාන්‍ය වී වල 1968 දී බුසලකට 13.61 සිට රු. 15.86 දක්වා වැඩිවිය.

උපයෝගී කොට ගත හැකි වඩා යහපත් වාරිමාර්ග පහසුකම් සමග, 1968 මහ කන්නයේ අස්වද්දන ලද ඉඩම් ප්‍රමාණය හැත්තෑ එක් දහසකින් වැඩි විය. කෙසේ නමුත්, ඉකුත් වර්ෂයේ යල කන්නය හා සසඳන කල, 1968 යල කන්නයේ දී මෙම ප්‍රමාණය, අක්කර හාර දහසකින් පහල වැටිණ. වපුරන ලද මුලු අක්කර ප්‍රමාණයෙන්, ඉකුත් වර්ෂයේ මහ කන්නයේ අක්කර 657,412 හෙවත් සියයට 62.2 හා සසඳන කල 1967/68 මහ කන්නයේ අක්කර 897,496 හෙවත් සියයට 78.2 ප්‍රමාණයක්, වැඩි ඵලදාවක් ලැබෙන වී වර්ග වලින් යුක්ත විය. 1968 වර්ෂයතුලම උපයෝගී කොට ගත් පෝර ප්‍රමාණය ටොන් 30,000 කින් වැඩි විය.

මුළු කෘෂිකාර්මික ණය ප්‍රමාණයෙන්, ගොවීන්ට සපයන ලද වැඩි ණය ප්‍රමාණය ( සියයට 85 පමණ ) 1967 රුපි. දශ ලක්ෂ 4.2 වැඩිවීම හා සසඳන කල 1968 දී රුපි. දශ ලක්ෂ 40.3 කින් ඉහල ගියේ ය.

වී නිමැවුම වැඩිවීම හේතු කොට ගෙන සහතික මිල ක්‍රමය යටතේ මිලදී ගත් ප්‍රමාණය, 1967 බුසල් දශ ලක්ෂ 13.1 සිට, 1968 වී බුසල් දශ ලක්ෂ 14.9 දක්වා වැඩිවිණ.

## අනෙකුත් කෘෂිකර්මාන්ත සහ පශු ධන නිෂ්පාදන

නිෂ්පාදක මිල අනුව අගය කළ අතිරේක ආහාර බෝගවල නිමැවුම, 1968 දී සියයට 25.7 කින් ඉහළ ගිය බව, තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. 1967 වර්ෂයේ අනුරූපිත

කන්නයන් හා සසඳන කල, මහ කන්නයේ නිමැවුමේ අගය සියයට 14.0 කින් ද, යල කන්නයේ අගය 36.5 කින් ද, වැඩි විය. 1968 මහ කන්නයේ අතිරේක භෝගවලට යටත් වූ ඉඩම් ප්‍රමාණය 1967 වර්ෂයේ මහ කන්නයට වඩා සියයට 3.8 කින් වැඩි විය. 1968 දී කිරි ආහාර නිමැවුම සියයට 6.9 කින් වැඩිවිය. රජයේ ගොවිපළේ කිරි නිෂ්පාදනය සියයට 4.3 කින් ඉහළ ගියේය. කිරි මණ්ඩලය කිරි මිල දී ගැනීම 1967 වර්ෂයේ කිරි බෝතල් දශ ලක්ෂ 17 සිට 1968 වර්ෂයේ කිරි බෝතල් දශ ලක්ෂ 23 දක්වා ඉහළ ගියේ ය. 1968 වර්ෂයේ බිත්තර නිෂ්පාදනය ද සියයට 2.7 කින් වැඩි විය.

### ධීවර කර්මාන්තය

නිෂ්පාදක මිල අනුව අගය කළ ධීවර නිෂ්පාදිතය සියයට 29.5 ක වැඩිවීමක් වාර්තාවී ඇත. මෙම වැඩිවීමට තරමක් දුරට හේතු වූයේ ක්‍රියාකාරීවූ ධීවර යාත්‍රා ගණන වැඩිවීමය. 1967 වර්ෂ අවසානයේ ටොන් 11 හේ මාළු අල්ලන බෝට්ටු 25 ක් වුවද, 1968 වර්ෂය අවසන් වන විට, එම ගණන 39 ක් දක්වා වැඩි විය. ඉකුත් වර්ෂය හා සසඳන කළ 1968 වර්ෂයේ දී ධීවර සංස්ථාව මගින් කළ මාළු නිමැවුම රාත්තල් දශ ලක්ෂ 2 කින් වැඩි විය.

### නිෂ්පාදන කර්මාන්ත

1968 තුල දී කාර්මික නිෂ්පාදනයේ ප්‍රමාණවත් වැඩිවීමක් පෙන්නුම් කරයි. නිෂ්පාදනයේ දී ඒ ඒ අවස්ථාවල දී එකතු කළ අගය ( තේ, රබර් හා පොල් හැර ) පවත්නා මිල අනුව සියයට 18. 2 කින් ද, ස්ථාවර මිල අනුව සියයට 11. 4 කින්ද වැඩිවිය. පොදු සමායතනයන් හී සිමෙන්ති, යකඩ බඩු, පිඟන් බඩු, ටයර් හා ටියුබ්, කුකුළු ආහාර සහ සත්ව ආහාරවල දී, පෞද්ගලික අංශය විදුලි යන්ත්‍රෝපකරණ, රබර් භාණ්ඩ, ඇඳුම්, සැඳු නිෂ්පාදන හා රස කැවිලි යනාදියෙන් නිමැවුමේ වැඩිවීම් දක්නට ලැබිනි.

රාජ්‍ය අංශයේ කර්මාන්ත සමායතනවල වැඩි වූ නිමැවුමට, සෑහෙන දුරකට හේතු වූයේ උපයෝගී කොට ගත හැකි හැකියාවන් වලින් ඉහළ මට්ටමේ ප්‍රයෝජන ලබා ගැනීම ද, අතික් අතින් ප්‍රාග්ධන තොගයේ ප්‍රසාරණය කිරීම ද වේ. කාර්මික සමායතනවල ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය, 1967 රුපි. දශ ලක්ෂ 39.1 සිට 1968 රුපි. දශ ලක්ෂ 115.0 දක්වා ඉහළ ගියේ ය.

කෙසේ වුවද, පෞද්ගලික අංශයෙහි නිමැයුම වැඩි වූයේ පවතින ධාරිතාවය වැඩියෙන් ප්‍රයෝජනයට ගැනීම නිසාය. 1968 වර්ෂයට පෙරාතුව පනවා තිබූ ආනයන සීමා කිරීම් කරණ කොට ගෙන අමු ද්‍රව්‍ය හිඟයකට මුහුණ පෑමට සිදුවීම නිසා බොහෝ ව්‍යාපාරික ආයතනයන් ධාරිතාවයට අඩුවෙන් නිෂ්පාදනය කළ බව දන්නා කරුණකි. 1968 මැයි මාසයේදී, වි. වි. හි.ස. ක්‍රමය විසින් අමු ද්‍රව්‍ය ආනයනය කිරීම ලිහිල් කරන ලදී. මෙකී පියවර මගින් පළමුව, විශාල අමු ද්‍රව්‍ය ආනයනයන් සඳහා ඇණවුම් කරවීමට නිෂ්පාදකයින්ට අප්‍රමාදව පෙළඹවූ අතර සහ දෙවනුව, පවතින අමු ද්‍රව්‍ය තොගයන් ප්‍රයෝජනයට ගැනීමට ක්‍රියාශීලි කළේය. තවද අපනයන සහ දේශීය කෘෂිකර්මයෙහි ආදයම වැඩි වීම, 1968 දී කාර්මික ප්‍රසාරණයක් සඳහා හිතකර වාතාවරණයක් සලසා දුන් බව සඳහන් කළ යුතුමය.

### තැනීම කටයුතු

1968 දී තැනීම් කටයුතු ඉහළ මට්ටමක් කරා පැමිණියේය. 1966 වර්ෂයට පෙර වර්ෂයන් කිහිපයක්ම ඒ සඳහා ඉතාමත් අවශ්‍ය අමු ද්‍රව්‍යයන් පිළිබඳ හිඟයකින් පෙලුනේය. මින් බොහොමයක්ම අපනයනයන් විය. එසේ වුවද, 1967 දී ගොඩ නැංවීමේ එකතුවූ වටිනාකම සියයට 19.9 කින් වැඩි වූයේ, ආනයනය කළ සහ දේශීය වශයෙන් නිපදවූ යන දෙවර්ගයෙහිම ගොඩනැගිලි උපකරණයන් ලබා ගැනීමට හැකිවීම නිසාය. 1968 දී ආනයනය කළ ගොඩ නැගිලි උපකරණයන්හි පරිමා දර්ශකය 1967 දී 65 සිට 1968 දී 74 දක්වා ඉහළ ගියේය. 1968 වර්ෂයේදී, ගොඩනැගිලි උපකරණ ලබා ගැනීමට හැකි වූයේ, පළමුව වි. වි. හි. ස. ක්‍රමය යටතේ ආනයන ලිහිල් කිරීම සහ දෙවනුව සිමෙන්ති සංයුක්ත මණ්ඩලයෙහි නිෂ්පාදනය වැඩිවීම නිසාය. ගොඩනැගිලි උපකරණ ආනයනය වැඩිවීමක් සිදුවූයේ 1968 තෙවැනි සතර වැනි කාර්තුවල දී පමණක් වූ නමුදු, වි. වි. හි. ස. ක්‍රමය ඇරඹීමත් සමග ඇණවුම් කරන ලද ආනයන භාණ්ඩවල සැපයුමෙහි වැඩිවීමක් බලාපොරොත්තු වූ වෙළෙන්දන් තමන් විසින් තබාගෙන තිබූ බඩු තොග අඩු කිරීම නිසා, ගොඩනැගිලි කරුවන් වෙත පැවති ගොඩනැගිලි උපකරණ සැපයුම 1968 මැයි, ජූනි මාසයන්හි දී වැඩිවිය. මෙම වර්ෂයේදී නිෂ්පාදන කටයුතු ඇරඹූ ගාල්ලේ පිහිටි කර්මාන්ත ශාලාවෙහි නිෂ්පාදනය ඉහලයාම හේතුකොට ගෙන, සිමෙන්ති සංයුක්ත මණ්ඩලයෙහි සිමෙන්ති නිෂ්පාදනය සියයට 16 කින් ඉහළ ගියේය.

පවත්නා මිල අනුව සියයට 33.9 කින් සහ ස්ථාවර මිල අනුව සියයට 27.1 කින් ගොඩනැගිලිවල එකතු වූ වටිනාකමෙහි වැඩිවීමක් ඇස්තමේන්තු කොට ඇත.

## සංඛ්‍යා සටහන II (අ) 4
## දළ ජාතික නිෂ්පාදිතය පවත්නා සාධක මිල අනුව

| | රුපියල් දශ ලක්ෂ | | | | | | | | | | පසුගිය වර්ෂවලට වඩා වූ වෙනස්වීමේ සියයට ගණන | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 | 1968 | 1966 | 1967 | 1968 |
| 1. කෘෂිකර්මය, දැවදැ වන ද්‍රව්‍ය, දඩයම් සහ ධීවර කර්මාන්තය ... ... ... | 2,302.4 | 2,389.7 | 2,456.1 | 2,392.3 | 2.600.2 | 2,663.5 | 2,522.5 | 2,608.1 | 2,879.3 | 3,655.9 | + 3.4 | +10.4 | +27.0 |
| 2. පතල් හා ගල් කැඩීම ... ... ... | 31.3 | 32.2 | 31.7 | 33.4 | 30.0 | 33.1 | 35.1 | 38.4 | 39.9 | 46.8 | + 9.4 | + 3.9 | +17.3 |
| 3. නිෂ්පාදනය ... ... ... ... | 682.1 | 711.7 | 709.5 | 748.9 | 783.6 | 819.4 | 918.5 | 866.2 | 911.0 | 1,160.3 | — 5.7 | + 5.2 | +27.4 |
| 4. තැනීම් කට යුතු ... ... ... ... | 282.9 | 283.1 | 279.1 | 297.0 | 285.4 | 306.3 | 286.9 | 317.2 | 380.2 | 508.9 | +10.6 | +19.9 | +33.9 |
| 5. විදුලිය, ගෑස්, ජලය සහ සනීපාරක්ෂක සේවා ... | 9.5 | 9.8 | 10.4 | 11.1 | 11.4 | 12.9 | 13.5 | 14.3 | 15.1 | 16.4 | + 5.9 | + 5.6 | + 8.6 |
| 6. ප්‍රවාහනය, ගබඩා කිරීම සහ පණිවුඩ හුවමාරුව ... | 540.9 | 587.3 | 578.9 | 633.6 | 636.6 | 706.3 | 775.6 | 829.2 | 841.5 | 910.7 | + 6.9 | + 1.5 | + 8.2 |
| 7. තොග හා සිල්ලර වෙළෙඳාම ... ... ... | 800.8 | 936.5 | 872.8 | 954.4 | 971.2 | 1,146.6 | 1,191.2 | 1,237.8 | 1,272.6 | 1,363.6 | + 3.9 | + 2.8 | + 7.2 |
| 8. බැංකු, රක්ෂණය සහ නිශ්චල දේපල ... ... | 50.9 | 51.5 | 58.4 | 64.5 | 68.5 | 75.9 | 93.2 | 85.8 | 107.4 | 138.6 | — 7.9 | +25.2 | +29.1 |
| 9. නිවාස අයිතිය ... ... ... ... | 200.6 | 213.5 | 233.1 | 248.6 | 260.3 | 275.3 | 294.0 | 314.0 | 335.5 | 366.3 | + 6.8 | + 6.8 | + 9.2 |
| 10. රාජ්‍ය පාලනය හා ආරක්ෂාව ... ... ... | 301.0 | 314.4 | 323.5 | 343.7 | 365.1 | 363.3 | 371.9 | 396.5 | 402.9 | 474.3 | + 6.6 | + 1.6 | +17.7 |
| 11. සේවා ... ... ... ... ... | 727.6 | 801.3 | 799.7 | 821.5 | 836.9 | 923.6 | 996.5 | 1,028.3 | 1,091.8 | 1,227.4 | + 3.2 | + 6.2 | +12.4 |
| 12. දළ දේශීය නිෂ්පාදිතය ... ... ... | 5,930.0 | 6,331.0 | 6,353.2 | 6,549.0 | 6,849.2 | 7,326.2 | 7,498.9 | 7,735.8 | 8,277.3 | 9,869.2 | + 3.2 | + 7.0 | +19.2 |
| 13. ශුද්ධ සාධක ආදායම — විදේශීය ... ... | —36.7 | —44.2 | —39.9 | —46.5 | —52.5 | —35.7 | —15.4 | —36.8 | —53.5 | —60.5 | | | |
| 14. දළ ජාතික නිෂ්පාදිතය ... ... ... | 5,893.3 | 6,286.8 | 6,313.3 | 6,502.5 | 6,796.7 | 7,290.5 | 7,483.5 | 7,699.0 | 8,223.8 | 9,808.7 | + 2.9 | + 6.8 | +19.3 |

විස්තර සටහන් සඳහා 48 වැනි පිටුව බලන්න.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

**සේවාවන්**

1968 දී සේවා අංශයෙහි ද සැළකිය යුතු ප්‍රමාණයකින් නිමැයුමෙහි වැඩිවීමක් සිදුවී ඇත. කෘෂිකර්මය, කර්මාන්ත සහ තැනීම් අංශයන්හි කටයුතු පුළුල් වීමත් සමග, ප්‍රමුඛ අංශයන්ට යෙදවුම් සපයන සමහර සේවාවන්හි, විශේෂයෙන්ම වෙළඳාම, ප්‍රවාහණය සහ බැංකු යන සේවාවන්හී ප්‍රසාරණයක් බලාපොරොත්තු වේ. උදහරණයක් වශයෙන් දුම්රිය සේවයෙහි ප්‍රවාහණය කරන ලද භාණ්ඩ ටොන් සැතපුම් ප්‍රමාණය සියයට 4.5 කින් ද වරාය සංයුක්ත මණ්ඩලය මගින් සිදුකළ නැව් භාණ්ඩ පැටවීම් සහ ගොඩබෑම් කටයුතු සියයට 5.0 කින් ද වැඩි වී ඇත. මූලික සහ ද්වීතිය අංශයන්හි නිමැයුමෙහි වර්ධනයට ස්වාධීනව සෙසු සේවාවන්හි නිමැයුම වැඩි වී ඇත. ගමනාගමනය සඳහා පාරිභෝගික ඉල්ලුමෙහි වැඩිවීම, ලංකා ගමනා ගමන මණ්ඩලයෙහි මගින් සැතපුම් ප්‍රමාණය සියයට 10.3 කින් සහ දුම්රිය සේවයෙහි එම සැතපුම් ගණන සියයට 7.7 කින් ද වැඩිවීම සඳහා තුඩු දුන්නේය. ඉල්ලුම වැඩිවීම කරණ කොට ගෙන, රජය මගින් සපයනු ලබන සෞඛ්‍යය, අධ්‍යාපනය සහ රාජ්‍ය පරිපාලන සේවාවන්හි එකතු වූ වටිනාකම් ද 1968 දී ඉහළ ගොස් ඇති බැව් වාර්තා වී ඇත. සේවා අංශයෙහි මුළු එකතු වූ වටිනාකම පවත්නා මිල අනුව සියයට 10.6 කින් සහ ස්ථාවර මිල අනුව සියයට 6.2 කින් ද වැඩි වී ඇත.

## දළ ජාතික නිෂ්පාදිතය පවත්නා සාධක වියදම් මිල අනුව

**නිෂ්පාදිත වටිනාකම පවත්නා මිල අනුව**

II (අ) 4 වැනි සංඛ්‍යා සටහනෙන්, පවත්නා සාධක වියදම් මිල අනුව ඇස්තමේන්තු කළ දළ ජාතික නිෂ්පාදිතය දක්වයි. 1968 දී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතය සියයට 19.3 තියුණු නැගීමක් වාර්තා කර ඇත. මෙය වනාහි, ප්‍රධාන වශයෙන් ම කෘෂිකර්මය, නිෂ්පාදන සහ ගොඩ නැංවීමේ ප්‍රතිඵලයකි.

1967 දී පසු බැසීමක් සිදුවූ අපනයන කෘෂිකර්මාන්ත නිමැයුම් වටිනාකම 1968 දී යහපත් විය. ප්‍රධාන අපනයන බෝග තුනෙහි නිමැයුම වැඩි වූ අතර, ඒවායේ මිලද තරමක් වේගයකින් ඉහළ ගියේ ය. තේ සියයට 1.8 කින්, රබර් සියයට 3.8 කින් සහ පොල් සියයට 7.7 කින් යනාදී වශයෙන් නිමැයුම වැඩි විය. කොළඹ වෙළඳ පොලෙහි ශුද්ධ සාමාන්‍ය තේ මිල සියයට 16.7 කින් සහ ආර්. එස්. එස්. අංක 1 රබර් මිල සියයට 11.4 කින් ඉහළ ගියේය. මුළු දිවයිනෙහි සාමාන්‍ය පොල් මිල 1967 දී ගෙඩිය ශත 18 සිට 1968 දී ශත 23 දක්වා ඉහළ ගියේය. සුළු ආනයන නිෂ්පාදිතයන්ගේ එකතු කළ වටිනාකම ද ඉහළ ගියේ, මිල සහ බොහෝ බෝගයන්හි නිෂ්පාදිත ප්‍රමාණයෙහි වැඩි වීමක් කරණ කොට ගෙනය. එකතු කළ වටිනාකමෙහි මෙයට වඩා විශාල වැඩිවීමක් දේශීය කෘෂිකර්මයෙහි දක්නට ලැබුණි. යහපත් කාළ ගුණ තත්වයන් යටතේ සහ රජයේ දිරි ගැන්වීම හේතු කොට ගෙන වී නිෂ්පාදිතය සියයට 17.2 කින් ඉහළ ගියේ ය. සියයට 16.5 කින්, එනම් බුසල රුපියල් 13.61 සිට රුපියල් 15.86 දක්වා වී සඳහා වූ නිෂ්පාදකයින්ගේ සාමාන්‍ය මිල ද ඉහළ ගියේය. දේශීය කෘෂිකර්මයෙහි එකතු කළ වටිනාකම 1968 දී සියයට 28.8 කින් වැඩි විය. මුළු කෘෂිකර්මයෙහි සමස්ත වටිනාකම සියයට 27.1 කින් වැඩි වී ඇති බව ඇස්තමේන්තු කොට ඇත.

ආනයන කළ අමු ද්‍රව්‍ය සඳහා වි. වි. හි. ස. ක්‍රමය යටතේ දෙන ලද සානුබලයන් යටතේ, නිෂ්පාදන භාණ්ඩයන්හි ( තේ, රබර් සහ පොල් හැර ) දේශීය නිෂ්පාදිත භාණ්ඩ නිමැයුමෙහි වටිනාකම 1968 දී තියුණු ලෙස වැඩි වූයේය. විදුලි උපකරණ, රබර් භාණ්ඩ, සකස් කරන ලද ලෝහ, ඇඳුම් පැළඳුම් සහ සාදන ලද ලෝහ නිෂ්පාදිත, සිමෙන්ති සහ සිමෙන්ති නිෂ්පාදිත, රස කැවිලි, ලෝහ භාණ්ඩ, පිහන් භාණ්ඩ, ටයර් හා ටියුබ් සහ සත්ව හා කුකුළු ආහාර යනාදියෙහි නිපැයුමෙහි වැඩිවීම් දක්නට ලැබුණි. නිෂ්පාදිත භාණ්ඩ නිමැයුමෙහි වැඩිවීම, සංයුක්ත මණ්ඩලයන් සහ පෞද්ගලික අංශය විසින් දරනු ලැබීය. 1967 නොවැම්බරයෙහි අවප්‍රමාණ කිරීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් ආනයන කරන ලද යෙදවුම්හි වියදම වැඩිවීම, 1968 මැයි මාසයේ දී වි. වි. හි. ස. ක්‍රමය ආරම්භ කරනු ලැබීම සහ සමහර ශ්‍රෙණිවල සේවකයින් සඳහා වූ අවප්‍රමාණය දීමනාවට අනතුරුව වැටුප් සඳහා වියදම වැඩිවීම නිසා බොහෝ නිෂ්පාදිත භාණ්ඩයන්හි මිල ද ඉහළ නැංගේය.

1968 දළ ජාතික නිෂ්පාදනයෙහි වැඩිවීම කෙරෙහි තැනීමේ කටයුතු වැදගත් වූ බලපෑමක් කළේය. තැනීමේ කටයුතුවල ප්‍රසාරණයෙහිලා දේශීය සහ ආනයන කළ ගොඩනැගිලි උපකරණයන්ගේ සැපයුම වැඩිවීම, ප්‍රධාන වශයෙන් වග කිව යුතු වන්නේය.

## සංඛ්‍යා සටහන II (අ) 5

### දළ ජාතික නිෂ්පාදිතය (1959) ස්ථාවර සාධක වියදම් මිල අනුව

| | රුපියල් දශ ලක්ෂ | | | | | | | | | | පසුගිය වර්ෂයට වඩා වූ වෙනස්වීමේ සියයට ගණන | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 | 1968 | 1966 | 1967 | 1968 |
| 1. කෘෂිකර්මය, දව, වන ද්‍රව්‍ය, දඩයම් සහ ධීවර කර්මාන්තය ... ... | 2,302.4 | 2,435.5 | 2,613.5 | 2,694.5 | 2,846.0 | 2,945.9 | 2,772.8 | 2,836.9 | 3,039.9 | 3,248.4 | + 2.3 | + 7.2 | + 6.9 |
| 2. පතල් හා ගල් කැඩීම ... ... | 31.3 | 32.4 | 31.8 | 33.2 | 29.5 | 32.1 | 34.0 | 37.1 | 37.0 | 37.3 | + 9.1 | —0.3 | + 0.8 |
| 3. නිෂ්පාදනය ... ... | 682.1 | 728.0 | 745.9 | 797.6 | 853.0 | 901.3 | 936.9 | 1,008.1 | 1,052.0 | 1,133.0 | + 7.6 | + 4.4 | + 7.7 |
| 4. තැනීම් කටයුතු ... ... | 282.9 | 280.9 | 268.6 | 281.5 | 271.8 | 283.3 | 266.2 | 293.2 | 350.8 | 446.0 | +10.1 | +19.6 | +27.1 |
| 5. විදුලිය, ගෑස්, ජලය සහ සනීපාරක්ෂක සේවා | 9.5 | 9.8 | 10.4 | 11.1 | 11.4 | 12.9 | 13.5 | 14.3 | 14.7 | 15.0 | + 5.9 | + 2.8 | + 2.0 |
| 6. ප්‍රවාහන, ගබඩා කිරීම සහ පණිවුඩ හුවමාරුව | 540.9 | 584.8 | 565.7 | 608.1 | 591.8 | 640.7 | 740.3 | 791.8 | 781.6 | 823.9 | + 7.0 | — 1.3 | + 5.4 |
| 7. තොග හා සිල්ලර වෙළඳාම ... ... | 800.8 | 928.8 | 839.4 | 891.9 | 875.1 | 1,003.1 | 1,105.2 | 1,144.1 | 1,174.3 | 1,253.3 | + 3.5 | + 2.6 | + 6.7 |
| 8. බැංකු, රක්ෂණ හා අනෙකුත් නිශ්චල දේපල ... | 50.9 | 51.8 | 58.5 | 64.2 | 67.4 | 73.6 | 90.4 | 83.0 | 99.6 | 110.4 | — 8.2 | +20.0 | +10.8 |
| 9. නිවාස අයිතිය ... | 200.6 | 211.8 | 224.2 | 235.8 | 227.2 | 254.8 | 272.8 | 272.8 | 265.4 | 274.7 | ... | — 2.7 | + 3.5 |
| 10. රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව ... | 301.0 | 314.4 | 323.5 | 343.7 | 365.1 | 363.3 | 371.9 | 396.5 | 388.9 | 432.4 | + 6.6 | — 1.9 | +11.2 |
| 11. සේවා ... ... ... | 727.6 | 754.2 | 783.3 | 798.1 | 812.3 | 886.0 | 960.9 | 992.3 | 1,021.4 | 1,125.8 | + 3.3 | + 2.9 | +10.2 |
| 12. දළ දේශීය නිෂ්පාදිතය ... | 5,930.0 | 6,332.4 | 6,464.8 | 6,759.7 | 6,950.6 | 7,397.0 | 7,564.9 | 7,870.1 | 8,225.6 | 8,900.2 | + 4.0 | + 4.5 | + 8.2 |
| 13. විදේශීය ශුද්ධ සාධක ආදායම ... | —36.7 | —43.9 | —40.1 | —49.8 | —50.9 | —33.7 | —14.3 | —36.1 | —44.5 | —38.7 | | | |
| 14. දළ ජාතික නිෂ්පාදිතය ... ... | 5,893.3 | 6,288.5 | 6,424.7 | 6,709.9 | 6,899.7 | 7,363.3 | 7,550.6 | 7,834.0 | 8,181.1 | 8,861.5 | + 3.8 | + 4.4 | + 8.3 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1968 වර්ෂයේදී, සේවා අංශයෙහි එකතු කළ වටිනාකම, එනම් ප්‍රවාහණ, වෙළඳාම, බැංකු සහ රක්ෂණ, නිවාස, රාජ්‍ය පරිපාලනය සහ සෙසු සේවා සියයට 10.6 කින් වැඩි වී ඇති බව ඇස්තමේන්තු කොට ඇත. මෙම සේවාවන්ගෙන් සැළකිය යුතු කොටසක්, එනම් භාණ්ඩ ප්‍රවාහණය, වෙළඳාම සහ බැංකු කටයුතු යනාදිය කෘෂිකර්මය, කර්මාන්ත සහ ගොඩනැංවීම් සඳහා යෙදවුම්වලට අයත් වෙයි. මෙකී සේවාවන් හි ප්‍රසාරණය ප්‍රධාන වශයෙන් ම සිදු වූයේ කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ තැනීමේ කටයුතු වල සිදුවූ වෘද්ධිය තුලිනි. පාරිභෝජන ඉල්ලුම වැඩිවීම හේතු කොට ගෙන සෙසු සේවාවන්හි ද ප්‍රසාරණයක් සිදුවිය. මේවා ප්‍රධාන වශයෙන්ම, මගීන් ගෙන යෑම, රාජ්‍ය පරිපාලනය සෞඛ්‍ය සහ අධ්‍යාපනය යනාදිය වේ. රාජ්‍ය පරිපාලනය සහ රජය විසින් සපයනු ලබන සේවාවන්හි එකතු කළ වටිනාකමෙහි වැඩිවීම 1968 දී සමහර සේවකයින්ට ගෙවන ලද වැටුප් වැඩිවීමේ ප්‍රතිඵලයකි.

දළ දෙශීය ජාතික නිෂ්පාදිතය 1968 දී සියයට 19.2 කින් එනම්, රුපි. දශ ලක්ෂ 8,277.3 සිට රුපි. දශ ලක්ෂ 9,869.2 දක්වා ඉහළ ගියේ ය. 1967 දී රුපියල් දශ ලක්ෂ 53.5 ක් වූ සාධක ආදයමෙන් රටින් පිටතට ගලාගිය ශුද්ධ මුදල් ප්‍රමාණය හා සසඳන කළ, 1968 දී රුපි. දශ ලක්ෂ 60.5 ක් විය. ශුද්ධ සාධක ආදයම් ගලා යෑමට අනුව, දළ දේශීය නිෂ්පාදිතය ගැලපීමෙන් ලබාගත් දළ ජාතික නිෂ්පාදිතය 1968 දී සියයට 19.3 ක ඉහළ යාමක් වාර්තාගත කළාය.

**මූර්ත නිෂ්පාදිතය සහ මූර්ත ආදයම**

**II** (අ) 5 සහ **II** (අ) 6 යන සංඛ්‍යා සටහන්, ඇස්තමේන්තු කළ මූර්ත නිෂ්පාදිතය සහ මූර්ත ආදයම දක්වයි. දළ ජාතික නිෂ්පාදිතය ස්ථාවර සාධක වියදම් මිල ( 1959 ) අනුව, 1968 දී සියයට 8.3 කින් කැපී පෙනෙන ලෙස වැඩි වී ඇත. මෙය වනාහි 1967 වෘද්ධි අනුපාතයට වඩා දෙගුණයකට ආසන්න වූ ප්‍රමාණයකින් ඉහළයාමකි. මුළු නිමැයුම සඳහා සියයට 36.7 ක් එකතු කළ කෘෂිකර්මාන්තයෙහි නිමැයුම, සියයට 6.9 කින් වැඩි විය. මෙය, මීට ඉහත දී සාකච්ඡා කළ තේ, රබර්, පොල් අතිරේක ආහාර බෝග, කිරි සහ බිත්තර නිෂ්පාදනයෙහි ඉහළ යෑම පිළිබිඹු කරයි.

නිෂ්පාදන කර්මාන්තයෙහි මූර්ත වටිනාකම සියයට 7.7 කින් වැඩි වූයේ ය. විදුලි උප කරණ, රබර් භාණ්ඩයන්, රෙදිපිළි, සිමෙන්ති සහ සත්ව සහ කුකුල් ආහාරයන් හී නිමැයුමෙහි කැපී පෙනෙන වැඩිවීම් ඇති වූයේ ය. තැනීම්වල මූර්ත වටිනාකම සියයට 27.1 කින් වැඩි වූයේ ය. රාජ්‍ය සංයුක්ත මණ්ඩලයන් හී තැනීම් කටයුතු සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගියේය. සියළුම සංයුක්ත මණ්ඩලයන් හී තැනීම් සඳහා වූ ආයෝජනය 1967 දී රුපි. දශ ලක්ෂ 98.2 සිට 1968 දී රුපි. දශ ලක්ෂ 163.4 දක්වා වැඩි වූයේ ය.

කෘෂිකර්මාන්තය, නිෂ්පාදන කර්මාන්තය සහ තැනීම් අංශයන් හී නිමැයුමෙහි වර්ධනයක් 1968 දී, සේවා අංශයෙහි නිමැයුමෙහි මූර්ත වටිනාකමෙහි තියුණු ඉහළ යෑමක් හා සමග සිදු විය. මෙය ප්‍රධාන වශයෙන් ම, භාණ්ඩ බෙදා හැරීම කරනු ලබන වෙළෙඳ සහ ප්‍රවාහන සේවා, බැංකු සහ මුල්‍ය ආයතනයන් මගින් සපයනු ලබන මූල්‍ය සේවා සහ රජය මගින් සපයනු ලබන සෞඛ්‍ය, අධ්‍යාපනය සහ රාජ්‍ය පරිපාලනය යනාදිය මගින් සපයනු ලැබූ සේවාවන් හී වැඩිවීම මගින් පිළිබිඹු කෙරෙයි.

ජාතික ආදයම් මට්ටම කෙරෙහි අපනයන සහ ආනයන වටිනාකමෙහි ඇති වැදගත් කම නිසා 1968 දී මූර්ත නිමැයුමෙහි සිදුවූ පුලුල්වීම ආනයන සහ අපනයන මිල චලනයන්ට අනුව අනුපාතයෙහි පිරිහීමේ උපනතිය එලෙසම පැවතියේය. ලංකාවේ ආනයනයන්ට අනුව අපනයනයන්හි ක්‍රයශක්තිය අඩු කරමින්, වර්ෂය තුළදී වෙළෙඳ අනුපාතය සියයට 7.9 කින් පහළ වැටුනි. 1959 වර්ෂය පදනම් කොට බලන කළ වෙළඳ අනුපාතයෙහි අයහපත් වෙනස්වීම් සිදු කොට ගෙන 1967 දී ඇස්තමේන්තු කළ ආදයම අඩුවී යෑම, රුපියල් දශ ලක්ෂ 667.1 ක්වූ අතර, 1968 දී රුපියල් දශ ලක්ෂ 821.3 ක් විය. අයහපත් වෙළඳ අනුපාතය හේතු කොට ගෙන අහිමිවී ගිය ආදයම අනුව මූර්ත නිෂ්පාදනයෙහි ඇස්තමේන්තු ගැලපීමෙන් ලබා ගත් මූර්ත ජාතික ආදයම 1967 දී රුපියල් දශ ලක්ෂ 7,514.0 ක් වූ අතර, 1968 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 8,040.2 ක් විය.

**ඒකජන නිෂ්පාදිතය සහ ආදයම**

1936 සියයට 2.4 ක සහ 1967 සියයට 2.3 ක ඉහළයාම හා සසඳනවිට සියයට 2.2 ක මෙම ඉහළයාමෙන් ජනගහන වර්ධනයේ පහළ වැටීමේ උපනතියක් පෙන්නුම් කෙරේ. මෙයට ප්‍රධාන හේතුව මෑත අවුරුදුවල දළ මරණ අනුපාතයෙහි පහළ වැටිමය. අධ්‍යාපනයේ

## සංඛ්‍යා සටහන II (අ) 6

### මූර්ත ජාතික ආදායම සහ වියදම

| | රුපියල් දශ ලක්ෂ | | | | | | | | | | පසුගිය වර්ෂවලට වඩා වැඩිවීමේ සියයට ගණන | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 | 1968 | 1967 | 1968 |
| 1. දළ ජාතික නිෂ්පාදිතය (1959 ස්ථාවර සාධක වියදම් මිල අනුව) ... ... ... ... | 5,893.3 | 6,288.5 | 6,424.7 | 6,709.9 | 6,899.7 | 7,363.3 | 7,550.6 | 7,834.0 | 8,181.1 | 8,861.5 | +4.4 | +8.3 |
| 2. පහත සඳහන් අපනයන හේතු කොට ගෙන වෙළඳ අනුපාතයේ ඇතිවූ බලපෑම | | | | | | | | | | | | |
| (1) තේ ... ... ... ... ... | | – 31.9 | – 36.9 | + 1.4 | –133.7 | –156.0 | –211.8 | –317.7 | –419.2 | –513.2 | | |
| (2) රබර් ... ... ... ... ... | | +37.3 | – 24.5 | – 13.3 | – 55.7 | – 93.7 | –103.5 | –145.3 | –190.1 | –261.8 | | |
| (3) තෙවැදෑරුම් ප්‍රධාන පොල් නිෂ්පාදිත ... ... | | – 26.0 | – 90.3 | – 79.6 | – 63.1 | – 84.4 | – 12.0 | – 44.6 | – 54.7 | – 26.8 | | |
| (4) අනෙකුත් නිෂ්පාදිත ... ... ... | | +10.0 | + 1.1 | + 9.6 | +10.7 | +18.3 | +18.4 | + 2.3 | – 3.1 | – 19.6 | | |
| (5) සියළු ම නිෂ්පාදිත ... ... ... | | – 10.6 | –150.6 | – 81.9 | –241.8 | –315.8 | –308.9 | –505.3 | –667.1 | –821.3 | | |
| 3. දළ ජාතික ආදායම (1959 ස්ථාවර සාධක වියදම් මිල අනුව) ... ... ... ... | 5,893.3 | 6,277.9 | 6,274.1 | 6,628.0 | 6,657.9 | 7,047.5 | 7,241.7 | 7,328.7 | 7,514.0 | 8,040.2 | + 2.5 | + 7.0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

# II (අ) 7 වැනි සංඛ්‍යා සටහන
## දළ ජාතික වියදම්-පවත්නා වෙළෙඳ මිල අනුව

| | රුපියල් දශ ලක්ෂ | | | | | | | | | | පසු ගිය වර්ෂයට වඩා වැඩි වූ වෙනසෙහි සියයට ගණන | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 | 1968 | 1967 | 1968 |
| 1. පෞද්ගලික පාරිභෝජනය ... | 4,635.7 | 5,019.9 | 4,911.7 | 5,009.6 | 5,339.1 | 5,754.8 | 5,880.9 | 6,273.7 | 6,711.6 | 7,550.4 | + 7.0 | + 12.5 |
| අ. භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයනය ... | 1,989.7 | 2,058.9 | 1,845.3 | 1,868.0 | 1,675.6 | 1,861.4 | 1,719.2 | 18,76.5 | 1,518.0 | 5,137.1 | — 19.1 | + 1.3 |
| ආ. මෙරට නිපදවන භාණ්ඩ හා සේවා ... | 2,646.0 | 2,961.0 | 3,066.4 | 3,141.6 | 3,663.5 | 3,893.4 | 4.161.7 | 4.397.2 | 51,93.6 | 6,013.3 | + 18.1 | + 15.8 |
| 2. රජයේ පාරිභෝජනය ... | 881.3 | 911.0 | 926.2 | 979.4 | 1,010.1 | 1,090.1 | 1,156.7 | 1,158.3 | 1,228.3 | 1,407.8 | + 6.0 | 14.6 |
